අනුරාධපුර මහා නගර සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
------------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින නගරාධිපති වෙත යවා ඇත.

1.2 මතය ව්‍යාවනය
--------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් සහ අධිගාස්තු රු.71,266,393 ක් වුවත් ආදායම් වියදම් ගිණුමේ එය රු.65,008,065 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.6,258,328 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2017 වර්ෂයේ උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබාදී තිබුණු එකතුව රු.9,870,000 ක් වටිනා කසල දාහක යන්ත්‍රය හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන යන්ත්‍රයේ වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශේෂ පත්‍ර සටහන් අනුව මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.99,462,571 ක් වුවත් තක්සේරු වාර්තා අනුව එම අගය රු.89,555,872 ක් වන බැවින් එම ප්‍රත්‍යාගණන අගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩසටහන 2014 යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ රු.4,477,042 ක් වැය කර අනුරාධපුර මහා නගර සභාවේ සති පොළෙහි ඉදිකිරීම් සහ නවීකරණය කිරීම් සිදුකර 2017 ජනවාරි මාසයේදී සභාවට භාරදී තිබූ නමුත් මෙම ඉදිකිරීම් වල වටිනාකම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් රු.46,888,185 ක් වැයකර සංවර්ධනය කර තිබුණ අනුරාධපුර මහා නගර සභාවට අයත් සංවර්ධන ව්‍යාපෘති 02 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) අයිතිය තහවුරු නොවූ සභාව මගින් ඉදිකිරීම් සිදුකර තිබුණ ඉඩම් හා ගොඩනැගිලි 10 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම හා විෂය පථය සීමාවීම

--------------------------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ගෙවීම් සඳහා විගණනයට ඉදිරිපත් කළ තොරතුරු පරීක්ෂා කිරීමේදී 2014 වර්ෂයේ සිට 2018 ජුනි මස දක්වා රු.39,541,400 ක වැටුප් වංචාවක් සිදුවී තිබෙන බව නිරීක්ෂණය විය. මෙම වංචාවේ නිවැරදි වටිනාකම තහවුරුකර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය වැටුප් හා දීමනා පිළිබඳව අදාල පෞද්ගලික බැංකුවට ප්‍රේෂණය කර තිබෙන ගෙවීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා අදාල වංචාව නිසා මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී තිබෙන බලපෑම තීරණය කළ නොහැකි විය.

(ආ) ලැබිය යුතු නිවාස කුලී රු. 2,168,708 ක් සඳහා හිග නිවාස කුලී ලේඛනය, ආපසු ගෙවන තැන්පත් රු. 101,625,234 ක් සඳහා යාවත්කාලීන කල තැන්පත් ලේඛනය හා පරිත්‍යාග රු.35,585,046 ක් සඳහා පරිත්‍යාග ලේඛනය, ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය

1.3.3 අනුකූල නොවීම්

--------------------

1.3.3.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

------------------------------------------------------------------------

නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.396 | නිකුත්කර මාස 06 ක් ඉක්මවූ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු.13,096 ක්වූ චෙක්පත් 9 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 (1) | කාලය ඉකුත්වූ සියළුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම සකස් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 73,677,445 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,128,550 ක් විය.

2.2 මූල්‍ය පාලනය
----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). තැන්පත් කර මාස 04 ක් ඉක්ම වු එහෙත් ගිණුමට බැරවී නොමැති වටිනාකම රු.87,250 ක් වු චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ.187 හා මු.රෙ.156 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). අංකය 0001471847 දරන බැංකු ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබී තිබුණු එකතුව රු.179,533 ක්වූ අගරු චෙක්පත් 05 ක් සඳහා මු.රෙ.486 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කළ වටිනාකම | 2017 වර්ෂයේ රැස්කළ ආදායම වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|
| | රු. | රු. | රු | රු. |
| වරිපනම් බදු | 84,012,328 | 65,001,600 | 66,479,382 | 82,534,546 |
| මුද්දර ගාස්තු | 30,000,000 | 30,000,000 | - | 60,000,000 |
| වෙළඳ බලපත්‍ර | 2,676,798 | 14,967,545 | 15,417,177 | 2,227,166 |
| නිවාස කුලී | 1,687,008 | 715,447 | 233,747 | 2,168,708 |
| කඩකුලී | 28,036,251 | 17,245,772 | 7,674,952 | 37,607,071 |
| පොදු වෙළඳසැල් කුලී | 3,904,568 | 5,666,445 | 6,477,414 | 3,093,599 |
| උසාවි දඩ | 2,350,620 | 429,416 | - | 2,780,036 |
| එකතුව | 152,667,573 | 134,026,225 | 96,282,672 | 190,411,126 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායම රු.152,667,573 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ එම හිඟ ආදායම් අයකරගත් බවට තහවුරු කරගැනීමට හැකිවන පරිදි ආදායම් ලේඛන නඩත්තු කර නොතිබුණි.

(ආ) 2017 ජනවාරි 01 දිනට පැවති හිඟ නිවාස කුලී හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,687,008 ක් හා රු.30,000,000 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එම වටිනාකම රු.2,168,708 ක් හා රු.60,000,000 දක්වා වැඩිවී තිබුණි.

2.3.2 වරිපනම්

-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු. 82,534,546 ක් මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 252 වගන්තිය පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 හිඟ කඩකුලී

---------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ 633 කින් හිඟ කඩකුලී රු. 40,700,670 ක් මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 253 වගන්තිය පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 වෙළඳ බලපත්‍ර

-----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ස්ථාන 159 කින් රු.2,227,166 ක් වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු මහා නගර සභා ආඥා පනතේ ( 252 වන අධිකාරය ) 254 (අ) වගන්තිය පරිදි අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

-------------------

(අ) මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(ආ) අතුරු ව්‍යවස්ථා

-----------------

මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා ) පනතේ 02 වන වගන්තිය යටතේ පළාත් පාලන,නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 1989 ජනවාරි 20 දින අංක 541/17 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පල කරන ලද්දාවූ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා 2006 දෙසැම්බර් 22 දිනැති අංක 1477 දරන ගැසට්පත්‍රයේ පළකර තිබුණි. එම කර්තව්‍යයන් සමාලෝචිත වර්ෂයේ විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 272 වගන්තියේ සඳහන් කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබීම නිසා පහත සඳහන් කරුණු විගණනයේදී තහවුරු කරගත නොහැකි වුණි.

(i) 2017 වර්ෂයට යාවත්කාලීන කල ආයතනයෙහි සංවිධාන ව්‍යුහයට අනුව අනුමත කාර්ය මණ්ඩලය, දැනට සිටින කාර්ය මණ්ඩලයේ තිබෙන යෝග්‍යතාවය හා කාර්ය මණ්ඩලයේ කාර්යඵල දර්ශක අනුව ප්‍රගතිය.

(ii) වර්ෂය තුල ඉටු කළයුතු අරමුණු පදනම්කර ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සැලැස්ම හා එම ක්‍රියාකාරකම් නිමකිරීමට නියමිත කාල රාමුව සහ එමගින් අපේක්ෂිත නිමවුම්/ප්‍රතිඵල ලබාගෙන තිබේද යන්න.

(iii) ප්‍රධාන ප්‍රසම්පාදනයන් සඳහන් වන ප්‍රසම්පාදන සැලැස්මක් නොවූ බැවින් සියළුම ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන අරමුණු මුල් කරගෙන මහා නගර සභාවට උපරිම දායකත්වයක් ඇතිවන පරිදි සිදුකර තිබේද යන්න.

(iv) රජයේ හෝ පළාත් සභා දායකත්වය මත සිදුකරන වියදම් සඳහා අවශ්‍ය අක්මුදල් නිසි පරිදි ඉල්ලුම් කර ලබාගෙන තිබුනේද යන්න.

(v) එක් එක් ආදායම් විෂයයන් යටතේ ආදායම් අය කිරීම සඳහා යාවත්කාලීනව බිල්කර කලානුරූපීව අයකර තිබුනේද යන්න සහ අයනොවූ ආදායම් අයකර ගැනීමට මහා නගර සභා ආඥපනතේ අදාල වගන්ති අනුව නාගරික කොමසාරිස් ක්‍රියාමාර්ග ගෙන තිබුනේද යන්න.

(vi) සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණනයක් ප්‍රමාණවත් පරිදි සිදුකර ආයතනයේ අභ්‍යන්තර පාලනය කොතරම් දුරට නිවැරදි කර තිබුනේද යන්න.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් රු.5,040,000 ක් වටිනා කසළ දාහක යන්ත්‍රයක් සහ රු.4,830,000 ක් වටිනා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන යන්ත්‍රයක් ලබාදී තිබුණි. දෛනිකව මහා නගර සභා බල ප්‍රදේශය තුල එකතුවන දිරන කසළ ටොන් 18 ක් කොම්පෝස්ට් කිරීමට සහ නොදිරන කසළ ටොන් 23 ක් දහනය කිරීමට අදාල යන්ත්‍රවල ධාරිතාවය ප්‍රමාණවත් වී නොතිබුණ නමුත් එම යන්ත්‍රවල පවතින ධාරිතාවයෙන් උපරිම ප්‍රයෝජන ගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

(ඉ) පාරිසරික ගැටළු

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශය තුල දෛනිකව එක් රැස්වන ටොන් 41 ක් පමණ වූ කසළ වලින් සියයට 75 ක් වන දිරාපත් නොවන කසළ කීරික්කුලම යන ස්ථානයේ වලදැමීම හෝ පස් දමා වැසීම හේතුවෙන් අනාගතයේදී පාරිසරික හා සමාජීය ගැටළු මතුවීමට ඉඩකඩ පැවතුණි.

(ii) අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කුම්බිච්චන්කුලම වැව් රක්ෂිතය, වන්නියන්කුලම වැව් රක්ෂිතය, පොන්නාරම්කුලම වැව් රක්ෂිතය තුළ සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සම්බන්ධව තොරතුරු සහ වාර්තා රැස්කර ලේඛනගත කර එම ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. නාගරික අවශ්‍යතා සඳහා බීමට ජලය සපයන නුවර වැව සහ තිසා වැව් තාවුළු ආශ්‍රිත අනවසර ඉදිකිරීම් ස්ථාන පිළිවෙලින් 275 ක් සහ 130 ක් නිරීක්ෂණය වූ අතර එම ඉදිකිරීම් නිසා වැව් ජලය දූෂණයට ලක්වීමෙන් නාගරික බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වයට බලපෑම් ඇතිවී තිබුණි. නමුත් එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට නගර සභාව විසින් විධිමත් වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන ආහාරපාන අලෙවිසැල් බොහොමයක පාරිභෝජනයට නුසුදුසු හෝ කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය අලෙවි කරන බැවින් එකී හෝටල්වල පවිත්‍රතාවය පිළිබඳව 1991 අංක 20 දරන ආහාර (සංශෝධිත) පනතින් සංශෝධිත 1980 අංක 26 දරන ආහාර පනතේ විධිවිධාන අනුව එම වෙළඳසැල්වලට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව මහා නගර සභාව දැනුවත් වී නොතිබුණ බැවින් තිරසර සංවර්ධන ඉලක්ක කාර්ය සාධනය ලගා කර ගැනීමට අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය තුල ගෙන නොතිබුණි.

(උ) වාර්ෂික කාර්ය සාධන වාර්තාව

------------------------------------

මහා නගර සභාවේ 2017 වර්ෂය සඳහා රු.407,163,600 ක පුනරාවර්තන වියදමක් හා රු. 75,018,650 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණද, මහා නගර සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව නගර සීමාව තුල ජීවත්වන නගරවාසීන් මුල්කර ගනිමින් සහ නගරය පරිහරණයට පැමිණෙන නාගරික පාරිභෝගිකයන්ගේ සුබ විහරණය සඳහා දැනට මහා නගර සභාව සතු සියළුම සම්පත් භාවිතා කරමින් මහජන හිතකාමි, පරිසර හිතකාමි නෛතික පැවැත්මක් සහිත යෝජනා සමුහයක් නගරය තුල ස්ථාපිත කිරීම, පාලනය කිරීම හා ප්‍රශස්ථ මට්ටමක් පවත්වාගෙන යාම යනාදී අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ කාර්ය සාධන වාර්තාවක් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු.3,640,099 ක්වූ ගෙවිය යුතු විගණන ගාස්තු වලින් 2016 මැයි 30 වන විට රු2,905,849 ක් පියවා තිබුණු අතර ඉතිරි රු.734,250 ක් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ රු.4,777,042 ක් වැය කර ඉදිකරන ලද අනුරාධපුර මහා නගර සභාවේ සති පොළෙහි ඉදිකිරීම් සහ නවීකරණය කිරීම් කර 2016 ජනවාරි මාසයේදී මහා නගර සභාව වෙත භාරදී තිබුණු අතර 2018 ජුලි 30 දින වන විට සති පොළෙහි ඉදිකිරීම් මහ ජනතාවගේ ප්‍රයෝජනයට නොගෙන සම්පූර්ණයෙන් කඩා ඉවත් කර තිබුණි.

(ඇ) වාහන හා උපාංග වලට අදාල ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). පර්චස් එකක් රුපියල් මිලියනයක් පමණ වෙළඳ වටිනාකමක් ඇති මහ නගර සභාවට අයත් එකතුව පර්චස් 43.54 ක්වූ ඉඩම් කැබැලි 04 ක පිහිටි කුලී නිවාස 04 ක් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂ දක්වා කාලසීමාව තුල විධිමත් අනුමැතියකින් තොරව පදිංචිකරුවන්ට සින්නක්කරව පවරා දී තිබුණි.

(ආ). 2009 වර්ෂයෙන් පසු දේපලවල සිදුකර ඇති වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නව තක්සේරු වටිනාකම මත වරිපනම් ගාස්තු අය කිරීමට කටයුතු නොකිරීම නිසා මහා නගර සභාවට විශාල වරිපනම් බද්දක් අහිමි වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 07 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 14 සිට සියයට 174 දක්වා පරාසයකින් යුක්ත විචලනයන් සහ වියදම් විෂයයන් 05 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 51 සිට සියයට 83 දක්වා වූ පරාසයකින් යුක්ත විචලනයන් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛන සඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

----------------------------------------------------------------------

විගණන විමසුම් 21 ක් සඳහා 2018 මැයි 30 දින වනවිටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ මත ගණනය කළ හැකිව තිබූ ගනුදෙනුවල වටිනාකම රු.87,553,452 ක් විය.

5 පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර නාගරික කොමසාරිස්ගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | ----------- | ----------- |
| (අ) | මූල්‍ය පාලනය | (i) මූල්‍ය කටයුතු සම්බන්ධව දෛනිකව අධීක්ෂණය සිදු නොකිරීම.<br>(ii) මූල්‍ය කටයුතුවලට අදාල නිලධාරීන්ගෙන් ඇප ලබානොගැනීම.<br>(iii) උපලබ්ධි නොවූ ආදායම් හා අගරු චෙක්පත් පිළිබඳව කටයුතු නොකිරීම. |
| (ආ) | අභ්‍යන්තර පාලනය | (i) තනතුරුවලට අදාල නොවන රාජකාරී පැවරීම.<br>(ii) කාර්ය මණ්ඩල රාජකාරි කටයුතු අධීක්ෂණය නොකිරීම.<br>(iii) විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර ක්‍රියාත්මක නොකිරීම.<br>(iv) අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා ඉදිරිපත් නොකිරීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) වත්කම් ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව නඩත්තු නොකිරීම.<br>(ii) ස්ථාවර වත්කම් තක්සේරු කර ලේඛණගත නොකිරීම.<br>(iii) කාලීනව භාණ්ඩ සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් නොකිරීම. |
| (ඈ). | අයවැය | අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන ඒකකයක් ලෙස උපයෝගී කර නොගැනීම. |
| (ඉ). | ණයගැති හා ණයහිමි පාලනය | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඊ). | ආදායම් පාලනය | (i) හිඟහිටි ආදායම් අය නොකිරීම.<br>(ii) ආදායම් ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (උ) | වාර්ෂික සැලසුම් | iii. ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් නොකිරීම. |